චතුලේඛ අංකය: 94/6
මගේ අංකය: 3/1/2/26/94

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
අංක: 07, ශ්‍රේගරි පාවර,
කොළඹ 07.
1994.03. . දින.

ප්‍රධාන ලේකම්,
දිස්ත්‍රික් ලේකම්, පලාත් ඉඩම් කොමසාරිස්,

.....

ගම්පුවල් නිරීමේ යෝජනා ක්‍රමවල පානීය ජලය සඳහා ළිං තැනීම සඳහා වූ ආධාර ලබාදීම.

ගම් පුළුල් නිරීමේ ව්‍යාපාරවල පදිංචි, පවුල් 20කට එකක් බැගින් වශ පරිදි පානීය ජලය ලබා ගැනීම සඳහා ළිං තනා ගැනීමට එක් ළිඳකට උපරිම වශයෙන් රු. 28,000/-ක ආධාර මුදලක් **ශෙවීම** අනුමත කරමි.

02. සංශෝධිත ගෙවීම 1994.01.01 දින සිට ක්‍රියාත්මක වන අතර, මේ යටතේ ඉදි කරනු ලබන නිෂ්පාදන ළිං පහක සඳහාම අවශ්‍යතාවයන් සපුරා ලිය යුතුය.

ළිඳේ විෂ්කම්භය:

අඩුම වශයෙන් අඩි 07ක් විය යුතුයි. පෙදේදී ප්‍රාදේශීය නිලධාරියාගේ උපදෙස් හා ඔබේ අනුමැතිය මත විෂ්කම්භය වැඩිකළ හැකිය.

ළිඳේ ගැඹුර:

අඩුම වශයෙන් පොළව මට්ටමේ සිට අඩි 12ක් විය යුතුයි. නෙසේ වුවත් සාමාන්‍ය කාලගුණය සහිත කාලයන ළිඳේ ජල මට්ටම අඩි 06කටවත් තිබිය යුතුවේ.

ඇතුල් බැම්ම:

ළිඳේ ඇතුල් බැම්ම ගඩොලින් සහ සිමෙන්ති වලින්, හෝගල් සහ සිමෙන්ති වලින්, සිමෙන්ති ගඩොල් සහ සිමෙන්ති වලින් හෝ තැනිය යුතුය. ඇතුල් බැලි අඩු වශයෙන් අඩි 12ක් වත් ගැඹුරට බැඳිය යුතුය.

ළිං බැම්ම:

ළිං බැම්ම අඩුම වශයෙන් අඟල් 10ක් පළල විය යුතු අතර, පොළව මට්ටමේ සිට අඟල් 36ක් වත් උසට තිබිය යුතුය. නෙසේ වුවද දිස්ත්‍රික්කයට විශේෂ හේතූන් ගැන සලකා අවශ්‍ය යයි ඔබට පෙනී යන්නේ නම් ළිං බැම්මේ උස අඩු කළ හැකිය. උල්පත් ජලය ළිඳට ගලා ඒමට ඉඩ හැරීමට ඒ සඳහා ළිං පතුල විවෘතව තැබිය යුතු අතර, උල්පත් වලින් ජලය ගලා ඒම සඳහා ඇතුල් බැම්මේ ප්‍රමාණවත් පරිදි සිදුරු කැබිය යුතුය.

දිය බස්නාව:

ළිඳ වටලීම අඩි 05ක දිය බස්නාවක් තිබිය යුතුය. එම බස්නාව සිමෙන්ති බදාම යොදා ගඩොලින් තැනිය යුතු අතර, අඟල් 03ක බැවුමේ ගැට්ටක් තැනිය යුතුය. දිය බස්නාව, ළිං ගැට්ට පැත්තට උස්වන පේදු, වතුර බැස යන කාණුව පැත්තකට බැවිලුව ද තිබිය යුතුය. දිය බස්නාව සිමෙන්තියෙන් තැනිය යුතුය. ළිඳෙහි බේසම හා දිය බස්නාව සිමෙන්තියෙන් මැද තිබිය යුතුය.

වතුර ගලා යන කාණුව:

සිමෙන්ති, තුප්පු, ගඩොල්, කළුගල් හෝ කොරල් වලින් බැඳ සිමෙන්ති දැමූ අඩි 10ක කාණුවක් තැනිය යුතුය.

ගෙවීමේ ක්‍රමය:

(අ) උඩ සිට පතුල දක්වාම අභ්‍යන්තර විෂ්කම්භය අඩි 07ක් වීය යුතු අතර, ගැඹුර අඩි 12ක් වන ළිඳක අඩි 12ක් ඇතුල් බැමීමක්, පොළව මතුපිට බැමීම, දිය බස්නාව හා පිටට ගලා යන කාණුවකින් යුත් (තුමන අන්දමේ පයෙක හෝ ගල් අතර කණ ඇති) ළිඳක් සඳහා රු. 17,000/-ක් ගෙවිය හැක.

(ආ) ගල් සමූ නොවන්නේ නම්, තනිත අඩි 120 අමතරව දිගා අඩියක් රු. 350/- බැගින් ගෙවන්න. ඇතුලත බැමීම බඳින අවස්ථාවලදී ගෙවිය හැකි මුදල කියුබ් එකකට රු. 400/-ක උපරිමයකට යටත් වේ. තෙසේ වූවද ළිඳක් සඳහා ගෙවන ලුහු මුදල රු. 28,000/- නොඉක්මවිය යුතුය. (පහත ඇති අංක. 2 සටහන බලන්න.)

(ඇ) අඩි 12කට වඩා ගැඹුරේ දී කලුගල් හපු වන්නේ නම් කාරපු ලබන දිග අඩියකට රු. 1000/- බැගින් ගෙවන්න. කුඩුගල හපුවී ඇත්නම් දිග අඩියකට රු. 700/- බැගින් ගෙවන්න. මේ වූවද ළිඳක් සඳහා ගෙවන ලුහු මුදල රු. 28,000/- නොඉක්මවිය යුතුය. (පහත ඇති අංක. 2 සටහන බලන්න.)

(ඈ) මෙහි පහත දක්වා ඇති ප්‍රමාණයන් අනුව ළිඳ කාරා අවසන් වූවද ජලය නොමැති නම් ඉහත කාරපු ලබන සෑම දිග අඩියක් සඳහාම රු. 1000/- බැගින් ගෙවිය හැකිය. මෙහිදී වූවද උපරිමය රු. 28,000/- නොඉක්මවිය යුතුය. නෙසේ වූවත් මෙවැනි අවස්ථාවකදී ඔබගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

ගෙවීමේ පදනම:

අඩි 7X12 ළිඳක් සඳහා දක්වා ඇති අවම අනුපාතවලට අනුකූලව.

පළවෙනි ගෙවීම:- තැනීම සම්පූර්ණ කිරීමේදී රු. 3000/-.

දෙවෙනි ගෙවීම:- පොළවේ මතුපිට කෝප්ප යකින ඇතුල් බැමීම සම්පූර්ණ කිරීම-රු. 11,500/-.

තුන්වෙනි ගෙවීම:- දිය බස්නාව යකින වතුර ගලා යන කාණුව කණ අවයන් කිරීමෙන් පසුව රු. 2500/-.

ලුහු මුදල :- රු. 17,000/-

සටහන:

(1) පරිණිෂ්ඨ නිලධාරියෙකු විසින් ප්‍රමාණවත් ලෙස වතුර නිබෙන බවට සහතික කරන තෙක් අධාර ලාභියාට ඇතුල් බැමීම බඳිමට ලුඩ නොදිය යුතුය.

(2) රුපියල් 17,000/-ක අධාර ලැබීම සඳහා මූලික වතුයෙන් අවශ්‍ය සෑයි වීශේෂ වීස්තරයෙහි නියම කර ඇති ප්‍රමාණයන් ඉක්මවා ගැඹුර හෝ විෂ්කම්භය වැඩි කිරීම වෙනුවෙන් රු. 11,000/-ක උපරිමයක් දක්වා ගෙවීම් කළ හැකිය.

(පී. ටී. ප්‍රතිරාජ)
ලුඩ් කොමිසාරිස්

වෂ්. 18.

පිටපත: